# ආරක්ෂක අමාත්‍යාංශය

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## ප්‍රසම්පාදන දැන්වීමයි

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදු කිරීමට නියමිත පහත සඳහන් ප්‍රසම්පාදනයන් සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් තීරණය කර තිබේ. ඒ අනුව, පහත සඳහන් භාණ්ඩ හා සේවා සඳහා අදාළ සැපයුම්කරුවන් හට තම අභිමතය පරිදි මුද්‍රා තැබූ මිල ගණන් ඉදිරිපත් කළ හැක.

| ප්‍රසම්පාදන අංකය | ප්‍රසම්පාදනය | ඒ සඳහා මිලදී ගැනීමට අවශ්‍ය අයිතම හා ප්‍රමාණයන් |
|---|---|---|
| DMC/FIN/2024 (PROCU:03) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා, හදිසි ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගැනීම | 30 Nos. of Mega Phones<br>75 Nos. of Search Light<br>250 Nos. of Throwing Bags<br>05 Nos. of Catamaran<br>05 Nos. of Manila Ropes (100m)<br>02 Nos. of Rescue Ropes (210m)<br>20 Nos. of Chain Saw<br>01 No. of Stock Handling Inventory Software |

2024 මාර්තු මස 04 වන දින සිට 2024 මාර්තු මස 25 වන දින දක්වා වැඩ කරන ඕනෑම දිනක පෙ:ව 09.00 සිට ප:ව 03.00 දක්වා, කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ, 3 වන මහලේ මුදල් අංශයෙන් ප්‍රසම්පාදන පත්‍රිකාව ආපසු නොගෙවන රු.1,000.00ක ගාස්තුවක් ගෙවීමෙන් පසු ලබාගත හැක.

ඒ අනුව, ඉහත සඳහන් ප්‍රසම්පාදන කාණ්ඩය සඳහා, ප්‍රසම්පාදන පත්‍රිකාව ඉදිරිපත් කළ යුතු අතර, එහිදී තම අභිමතය පරිදි අදාළ කාණ්ඩයේ එක් අයිතමයකට හෝ අයිතම සියල්ලටම මිල ගණන් ඉදිරිපත් කළ හැක. එලෙස ඉදිරිපත් කරනු ලබන මිල ගණන් වල මුළු වටිනාකම සඳහා 1% ක ලංසු සුරක්ෂණයක්ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍යය වේ.

තවද, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු වල ලිපි කවරයේ ඉහල වම් කෙළවර ලංසු ඉදිරිපත් කරන ප්‍රසම්පාදනයේ නම හෝ ප්‍රසම්පාදන අංකය සඳහන් කර, මුද්‍රා තබා (ආයතනයට ආවේනික වූ ස්ටිකරයක් හෝ ආයතනික රබර් මුද්‍රාව හෝ ලාකඩ මුද්‍රාව) සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන ඒකකය, මූල්‍ය අංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් හෝ 3 වන මහලේ මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලීම, 2024 මාර්තු මස 25 වන දින ප:ව 03.15 ට හෝ ඊට ප්‍රථම සිදු කළ යුතු අතර, එම වේලාවෙන් පසුව ලැබෙන සියළුම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත සඳහන් අයිතමයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා පමණක් පූර්ව ලංසු සාකච්ඡාවක් (Pre Bid Meeting) 2024 මාර්තු මස 18 වන දින පෙ.ව.10.30 ට මෙම මධ්‍යස්ථානයේ බිම් මහල් සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර, ඒ සඳහා ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට සහභාගී වීමට හැකියාව ඇත.

2024 මාර්තු මස 25 වන දින ප:ව 03.30 ට ලංසු විවෘත කිරීම සිදු කරන බැවින් එම අවස්ථාවට සහභාගී වීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට අවස්ථාව ලැබෙන අතර, ඒ සඳහා බලයලත් නියෝජිතයකු පැමිණෙන විට බලය පැවරීමේ ලිපියද රැගෙන පැමිණිය යුතුය. තවද, ප්‍රසම්පාදන ඇණවුම් ලබාදෙන අවස්ථාවේදී අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයන් වෙනස් කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන බව කාරුණිකව දන්වා සිටිමි.

**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**
**විද්‍යා මාවත, කොළඹ 07.**
**දු.අ. 0112 - 136270**